සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **ව්‍යවසායකත්ව අධ්‍යයනය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

01. ව්‍යවසායකත්වය යන්න වඩාත් හොඳින් නිරූපණය වන පිළිතුර තෝරන්න.
(1) දැනුම හා පමණක් සම්බන්ධ වූවකි. (2) සහජයෙන් පමණක් උරුම වන දෙයකි.
(3) අධ්‍යාපනය තුළින් ලැබිය හැකි දෙයකි. (4) පුද්ගලයෙකු හා සම්බන්ධ මනෝභාවයකි.

02. නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන ස්වභාවධර්මයෙන් ලැබී ඇති දෑ නිෂ්පාදන සාධකයක් වන,
(1) භූමියට අයත් වේ. (2) ඉඩම්වලට අයත් වේ.
(3) වනාන්තරවලට අයත් වේ. (4) අමුද්‍රව්‍යවලට අයත් වේ.

03. පරිසරයේ ඇති ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට පුද්ගලයෙකුට ඇති හැකියාව හඳුන්වන්නේ,
(1) පරිසර සංවේදී බව ලෙස ය. (2) නිර්මාණශීලීත්වය ලෙස ය.
(3) ආත්ම විශ්වාසය ලෙස ය. (4) නම්‍යශීලීත්වය ලෙස ය.

04. ව්‍යවසායකයා නිරතුරුව ම විශ්වාස කරන්නේ,
(1) දෛවය පිළිබඳව ය. (2) ස්වාධීනත්වය පිළිබඳව ය.
(3) තමා පිළිබඳව ය. (4) තම කැපවීම පිළිබඳව ය.

05. ව්‍යවසායකයෙකුගේ නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකයකි.
(1) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම. (2) ගැටලුවකට විසඳුම් ගණනාවක් ඇතැයි සිතීම.
(3) ප්‍රායෝගික වීමට බාධා නැතැයි සිතීම. (4) රීති හා සම්ප්‍රදායන් අවබෝධයෙන් පිළිපැදීම.

06. ව්‍යවසායකයින් අසාර්ථකත්වය සලකන්නේ,
(1) පරාජයක් ලෙස ය. (2) අත්දැකීම් ලෙස ය.
(3) තර්ජනයක් ලෙස ය. (4) ජයග්‍රහණයක් ලෙස ය.

07. විවිධත්වය ග්‍රහනය කර ගැනීම යනු,
(1) නවෝත්පාදනය සිදුවන ආකාරයකි.
(2) නිර්මාණශීලීත්වයට බාධාකාරීවන ආකාරයකි.
(3) නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ආකාරයකි.
(4) නම්‍යශීලීත්වය වර්ධනය කර ගත හැකි ආකාරයකි.

08. ව්‍යාපාරයකට බලපෑම් එල්ලකරන බාහිර පරිසර බලවේගයකි.
(1) රජය (2) අයිතිකරුවන් (3) කළමනාකරුවන් (4) සේවකයින්

09. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයකි.
(1) දිගුවක් (2) අනුකරණය කිරීමක් (3) සංකලනයක් (4) අනපේක්ෂිත සිදුවීමක්

10. පර්යේෂණ හා අත්හදා බැලීම් මගින් නවතම භාණ්ඩ හෝ සේවා නිපදවීම සිදුවන්නේ,
(1) ක්‍රියාවලි අවශ්‍යතාවයක් මත ය. (2) ජන ජීවිතයේ සිදුවන වෙනස්වීම් මත ය.
(3) තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම මත ය. (4) දැනුම පදනම් කරගත් සංකල්ප මත ය.

11. ව්‍යවසායකයෙකු මුහුණ දෙන අවදානම හා ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාවය මනාව පැහැදිලි වන පිළිතුර තෝරන්න.

(1) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ඉහළ වීම.

(2) අවදානම පහළ නම් ප්‍රතිලාභය ඉහළ වීම.

(3) ප්‍රතිලාභ ඉහළ නම් අවදානම පහළ වීම.

(4) අවදානම හා ප්‍රතිලාභ අතර සම්බන්ධතාවයක් නොමැති වීම.

12. ව්‍යවසායකයින් තුළ පොදුවේ දැකිය හැකි ගති ලක්ෂණ පමණක් ඇති පිළිතුර තෝරන්න.

(1) කැපවීම, සාමාන්‍ය වැටහීම, ආත්ම විශ්වාසය

(2) ස්වයං පෙළඹීම, දැඩි ආශාව, නිර්මාණශීලීත්වය

(3) ස්වාධීනත්වය, ආත්ම විශ්වාසය, අවදානම් භාර ගැනීම

(4) නවෝද්පාදනීය බව, කැපවීම, පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම

13. පරිසරයේ සිදුවන වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගත වීමට ව්‍යවසායකයෙකුට ඇති හැකියාව හඳුන්වන්නේ,

(1) ස්වාධීනත්වය ලෙස ය. (2) නම්‍යශීලීත්වය ලෙස ය.

(3) නිර්මාණශීලීත්වය ලෙස ය. (4) සාමාන්‍ය වැටහීම ලෙස ය.

14. මිනිසුන්ගේ ජීවිතය පවත්වාගෙන යාමට අනිවාර්යෙන් ම සපුරා ගත යුත්තේ,

(1) ආශාවන් ය. (2) වුවමනාවන් ය. (3) අවශ්‍යතාවයන් ය. (4) ආරක්ෂාවන් ය.

15. භාණ්ඩවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) අස්පෘශ්‍ය වීම, සපයන්නාගෙන් වෙන්කළ හැකි වීම, ගබඩා කළ හැකි වීම.

(2) සපයන්නාගෙන් වෙන් කළ හැකි වීම, ගබඩා කළ හැකි වීම, ස්පෘශ්‍ය වීම.

(3) සමජාතීය බව ආරක්ෂා කළ හැකි වීම, ස්පෘශ්‍ය වීම, ගබඩා කළ නොහැකි වීම.

(4) ස්පෘශ්‍ය වීම, සපයන්නාගෙන් වෙන් කළ හැකි වීම, සමජාතීය බව ආරක්ෂා කළ හැකි වීම.

16. අවශ්‍යතාවල ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) අසීමිත වීම, මූලිකව පැන නැගීම, පොදු වීම

(2) ද්වීතියිකව ඇති වීම, අසීමිත වීම, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම.

(3) සීමිත වීම, සියලු දෙනාටම පොදු වීම, උප්පත්තියත් සමග ඇති වීම.

(4) මූලිකව පැනනැගීම, සියලු දෙනාටම පොදු වීම, ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ නොහැකි වීම.

17. මිනිස් වුවමනාවන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ආහාර, අධ්‍යාපනය, වාසස්ථාන (2) අධ්‍යාපනය, වාසස්ථාන, ප්‍රවාහනය

(3) සෞඛ්‍ය, ආරක්ෂාව, සන්නිවේදනය (4) බෙහෙත්, පොත්පත්, මහල් නිවාස

18. ව්‍යාපාරවල දැකිය හැකි ගතිලක්ෂණයක් වන්නේ,

(1) අවදානමට මුහුණ දීම. (2) අරමුණක් පැවතීම

(3) තරගයට මුහුණ දීම. (4) ගනුදෙනුවල නිරත වීම.

19. සාමාන්‍යයෙන් ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යවසායකයෝ හඳුන්වන්නේ,

(1) නිර්මාණශීලී ව්‍යවසායකයින් ලෙස ය. (2) නවෝද්පාදනීය ව්‍යවසායකයින් ලෙස ය.

(3) ව්‍යාපාර ව්‍යවසායකයින් ලෙස ය. (4) නම්‍යශීලී ව්‍යවසායකයින් ලෙස ය.

20. කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම යනු ව්‍යවසායකත්වයෙහි,

(1) සමාජයට හිමිවන ප්‍රතිලාභයකි. (2) රටට හිමිවන ප්‍රතිලාභයකි.

(3) ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයකි. (4) දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයකි.

21. වැඩි පිරිසක් ව්‍යවසායකත්වයට යොමු වීමෙන් සිදුවන්නේ සුළු පිරිසක් අතර බෙදී යන ආදායම බහුතර පිරිසක් අතර බෙදී යාමයි. මින් අදහස් වන්නේ,

(1) ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම යි.

(2) ප්‍රාදේශීය වශයෙන් සංවර්ධනයක් සිදුවීම යි.

(3) දේශීය වශයෙන් පවතින සම්පත් උපයෝජනය වීම යි.

(4) ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් බිහිවීම යි.

22. නිමැවුම් අපනයනය කිරීමෙන් විදේශ විනිමය ඉපයීමට හැකිවීම යන්න ව්‍යවසායකත්වයෙන්,

(1) ව්‍යවයසායකයාට හිමිවන ප්‍රතිලාභයකි.
(2) ප්‍රදේශයට අත්වන ප්‍රතිලාභයකි.
(3) සමාජයට හිමිවන ප්‍රතිලාභයකි
(4) දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයකි.

23. භාණ්ඩ හා සේවා යන දෙවර්ගයට ම පොදු ලක්ෂණයක් වන්නේ,

(1) භෞතික පැවැත්මක් තිබීම

(2) සපයන්නාගෙන් වෙන්කළ හැකි වීම.

(3) ගබඩා කළ හැකි වීම.

(4) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කළ හැකි වීම.

24. ග්‍රාමීය ණය යෝජනා හඳුන්වා දුන් පුද්ගලයින් හඳුන්වන්නේ,

(1) ආයතනික ව්‍යවසායකයින් ලෙස ය.
(2) අභ්‍යන්තර ව්‍යවසායකයින් ලෙස ය.
(3) සමාජයීය ව්‍යවසායකයින් ලෙස ය.
(4) නිර්මාණශීලී ව්‍යවසායකයින් ලෙස ය.

25. ව්‍යාපාරයට අවශ්‍ය සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබන්නේ,

(1) සේවකයාගේ භූමිකාව යටතේ ය.
(2) කළමනාකරුගේ භූමිකාව යටතේ ය.
(3) නායකයාගේ භූමිකාව යටතේ ය.
(4) ප්‍රධානියාගේ භූමිකාව යටතේ ය.

26. නව නිෂ්පාදිත බිහි කිරීම, නව වෙළෙඳපොළවල් සොයා ගැනීම සිදු කරන්නේ ව්‍යවසායකයකු සතු,

(1) උපදේශන කුසලතා යටතේ ය.
(2) සංකල්පනාත්මක කුසලතා යටතේ ය.
(3) සන්නිවේදන කුසලතා යටතේ ය.
(4) සංවිධානාත්මක කුසලතා යටතේ ය.

27. නූතන ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි ලක්ෂණයකි.

(1) පාරිභෝගිකයා බලවත් වීම.
(2) තරගකාරීත්වය අඩු වීම.
(3) ලාභය ප්‍රධාන අරමුණ වීම.
(4) වෙනස්වීමේ වේගය අඩු වීම.

28. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සම්පත්, සේවකයෝ, ප්‍රජාව
(2) සම්පත්, සේවකයෝ, අයිතිකරුවෝ
(3) ප්‍රජාව, කළමනාකරුවෝ, සේවකයෝ
(4) තරගකරුවෝ, සම්පත්, සේවකයෝ

29. ව්‍යාපාරයක කාර්යයන්හි නිරතවන පුද්ගලයින් හඳුන්වන්නේ,

(1) අයිතිකරුවන් ලෙස ය.
(2) කළමනාකරුවන් ලෙස ය.
(3) සේවකයින් ලෙස ය.
(4) නායකයින් ලෙස ය.

30. ව්‍යාපාරයකට බලපෑම් එල්ල කරන ආසන්න පරිසර බලවේගයක් නොවන්නේ,

(1) තරගකරුවන් ය.
(2) ගනුදෙනුකරුවන් ය.
(3) කළමනාකරුවන් ය.
(4) සැපයුම්කරුවන් ය.

31. රටක ජනගහනය සහ ඔවුන්ගේ ජන ජීවිතය හා සම්බන්ධ සාධක ඇතුළත් වන්නේ,

(1) ප්‍රජා පරිසරයට ය.
(2) ආසන්න පරිසරයට ය.
(3) ආර්ථික පරිසරයට ය.
(4) ගෝලීය පරිසරයට ය.

32. ව්‍යාපාරවල බලපෑම සිදු කරන ස්වාභාවික පරිසරය තුල සිදුවන ආපදාවන් ව්‍යාපාරවලට,

(1) තර්ජන ඇති කරයි.
(2) සම්පත් සපයා දෙයි.
(3) අවස්ථා උදා කරයි.
(4) ශක්තීන් ඇති කරයි.

33. තොග හා සිල්ලර වෙළෙඳාම අයත් වන්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශයක් වන,

(1) සේවා අංශයට ය.
(2) තෘතීක අංශයට ය.
(3) නිෂ්පාදන අංශයට ය.
(4) ප්‍රාථමික අංශයට ය.

34. ව්‍යවසායකයෙකුට නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් නොවන්නේ,

(1) අසාර්ථකත්වය ඉවසීම
(2) කුතුහලය දිරිමත් කිරීම
(3) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
(4) ගැටලු අභියෝග ලෙස දැකීම

35. ව්‍යාපාරික තීරණ සාර්ථක හෝ අසාර්ථක වීමට ඇති ඉඩකඩ හැඳින්විය හැක්කේ,

(1) අවස්ථාවක් ලෙස ය.
(2) අභියෝගයක් ලෙස ය.
(3) තර්ජනයක් ලෙස ය.
(4) අවිනිශ්චිතතාවයක් ලෙස ය.

36. සියලු ම ව්‍යාපාර කටයුතු ආර්ථික කටයුතු ලෙස සැලකෙන්නේ,

(1) අවිනිශ්චිතතාවයන්ට මුහුණ දෙන නිසා ය.
(2) අඛණ්ඩව ගනුදෙනු සිදුවන නිසා ය.
(3) ලාභ අරමුණු කරගෙන ක්‍රියාත්මක වන නිසා ය.
(4) සීමිත සම්පත් භාවිතයට ගැනීම සිදුවන නිසා ය.

37. ව්‍යාපාරිකයෙකුට වඩා ව්‍යවසායකයෙකු තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

(1) අවදානම් භාර ගැනීම
(2) පොදු අරමුණක් පැවතීම
(3) නවෝත්පාදන හඳුන්වා දීම
(4) ඉහළ ප්‍රතිලාභයක් ලැබීම

38. ස්ථිර රැකියාවක නිරත වන පුද්ගලයෙකුට වඩා ව්‍යවසායකයෙකුට පමණක් ලැබිය හැකි ප්‍රතිලාභයක් වන්නේ,

(1) කීර්ති ප්‍රශංසා ලබා ගත හැකි වීම.
(2) භාවිතයට නොගත් හැකියා භාවිතයට ගත හැකි වීම.
(3) පහසුවෙන් ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකි වීම.
(4) නිශ්චිත පරිසර තත්ත්වයක් යටතේ කටයුතු කළ හැකි වීම.

39. වර්තමානයේ ප්‍රචලිත වෙමින් පවතින "විද්‍යුත් ගෙවීම් ක්‍රම" හැඳින්වෙන්නේ,

(1) දිගුවක් ලෙස ය.
(2) සංකලනයක් ලෙස ය.
(3) අනුකරණයක් ලෙස ය.
(4) සංකල්පයක් ලෙස ය.

40. ව්‍යාපාරයකට පාලනය කළ හැකි සාධක ක්‍රියාත්මක වන්නේ,

(1) ප්‍රජා පරිසරයට ය.
(2) ගෝලීය පරිසරයට ය.
(3) ආසන්න පරිසරයට ය.
(4) බාහිර පරිසරයට ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

| 10 ශ්‍රේණිය | ව්‍යවසායකත්ව අධ්‍යයනය - II | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පහත සිද්ධිය කියවා (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාසල් අධ්‍යාපනයෙන් පසු සූපවේදය හා හෝටල් කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරන ලද උදිත, විදේශ රටවල් කිහිපයක හෝටල් ක්ෂේත්‍රයේ රැකියා කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණ "ගැමි ගෙදර" නමින් නවතම ආකාරයේ ආපනශාලාවක් ආරම්භ කරන ලදී. එහිදී ඔහු විසින් රැකියාවෙන් ඉතුරු කරගත් මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් බැංකු ණයක් ලබා ගනිමින් සාර්ථක අන්දමේ දේශීය හා විදේශීය රටවල ආහාර වර්ග අලෙවි කිරීමේ ව්‍යාපාරය කරගෙන යන ලදී. උදිත විසින් දියවැඩියා ආදී බෝ නොවන රෝග සඳහා අවශ්‍ය වන ආහාර වර්ග සැපයීම මගින් වෙනස්වන වෙළෙඳපලට අදාළ සැපයුමක් සිදු කිරීම ප්‍රමුඛ කාර්යය ලෙස සැලකූ අතර ව්‍යාපාරය දිනෙන් දින දියුණුවීමත් සමග සේවකයින් පස් දෙනෙකුට රැකියා අවස්ථා ද ලබා දෙන ලදී. "ගැමි ගෙදර" ව්‍යාපාරය ආරම්භ කිරීමට මත්තෙන් ඒ පිළිබඳ වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර මනා සැලසුමක් සකස්කර තිබූ අතර සෑම මසකට වරක් සැලසුම් කල ආකාරයට කටයුතු සිදුවන්නේ දැයි පසු විපරම් කරනු ලබයි.

i. උදිත සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 04ක් සඳහන් කරන්න.

ii. ඔහුගේ ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාවක් හා වුවමනාවක් සඳහන් කරන්න.

iii. මෙම ව්‍යාපාරය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 02ක් ලියන්න.

iv. උදිතගේ නිෂ්පාදනය සඳහා පදනම් වී ඇති මූලාශ්‍රය කුමක් ද?

v. "ගැමි ගෙදර" ව්‍යාපාරයේ දැකිය හැකි දුර්වලතාවක් හා ශක්තියක් නම් කරන්න.

vi. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි අභ්‍යන්තර පරිසර සාධක 02ක් සඳහන් කරන්න.

vii. උදිත කුමන වර්ගයේ ව්‍යවසායකයෙක් ද?

viii. උදිත තම ව්‍යපාරය තුළ කළමනාකරුගේ භූමිකාවට අදාළව සිදුකරන කාර්යයන් 02ක් සඳහන් කරන්න.

ix. "ගැමි ගෙදර" ව්‍යාපාරය කුමන අංශයට අයත් ව්‍යාපාරයක් ද?

x. උදිතගේ නිර්මාණශීලීත්වය වර්ධනය කරගැනීම සඳහා කළහැකි ක්‍රියාමාර්ගයක් යෝජනා කරන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) (i) "ව්‍යවසායකත්වය" යන්න නිර්වචනය කරන්න.

(ii) භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා භාවිත කරන සම්පත් ප්‍රධාන නිෂ්පාදන සාධක 4කට වර්ග කරයි. නිෂ්පාදන සාධක 02ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පහදන්න.

(iii) නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක 02ක් නම් කරන්න.

(iv) "ව්‍යාපාරයක්" යන්න ඔබේ වචනයෙන් පහදන්න.

(v) මිනිසාගේ ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය "අවශ්‍යතා" වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ල. 2 × 5 = 10)

03. (i) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර දැකිය හැකි සමානකම් 04ක් ලියා දක්වන්න.

(ii) "සමාජීය ව්‍යවසායකයා" යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(iii) නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 02ක් යෝජනා කරන්න.

(iv) හාල්පිටි භාවිතයෙන් බේකරි නිෂ්පාදිත ඇති කිරීම නවෝත්පාදන සිදුවන ආකාරයකට උදාහරණයකි, අදාළ ආකාරය නම් කරන්න.

(v) ව්‍යාපාරවල පවතින අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ල. 2 × 5 = 10)

04. (i) නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ii) ව්‍යවසායකයෙකු තුළ ඇති මූලික ගති ලක්ෂණවලට අමතරව පවතින පොදු ගති ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

(iii) ව්‍යවසායකයෙකුට සමාජ සුභසාධනය උදෙසා කළ හැකි දෑ 04ක් යෝජනා කරන්න.

(iv) ව්‍යවසායකත්ව කාර්යයේ නියැලීම තුළින් ව්‍යවසායකයෙකුට ලැබිය හැකි ප්‍රතිලාභ 02ක් සඳහන් කරන්න.

(v) කුඩා පරිමාණ ව්‍යාපාරවල හඳුනාගත හැකි ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

(ල. 2 × 5 = 10)

05. (i) කුඩා පරිමාණ ව්‍යාපාර දේශීය ආර්ථික සංවර්ධනයට දායකවන ආකාර දෙකක් ලියා දක්වන්න.

(ii) "කුඩා ව්‍යාපාර විශාල වශයෙන් ආරම්භ වුව ද ඉක්මනින් අවසාන වීමද නිරීක්ෂණය වේ." මෙසේ කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපෑ හැකි හේතු 02ක් දක්වන්න.

(iii) ව්‍යවසාකයෙකු නායකත්ව භූමිකාවේදී ඉටුකරනු ලබන කාර්යයන් 02ක් නම් කරන්න.

(iv) ව්‍යවසායකයෙකු සතු විය යුතු "සංකල්පනාත්මක කුසලතාව" කෙටියෙන් හඳුන්වන්න.

(v) ව්‍යවසායකයෙකු තම භූමිකාව තුළ පණිවිඩ බෙදා හැරීම, රැස්වීම් පැවැත්වීම ආදිය සිදු කරයි. මෙම ක්‍රියාකාරකම් කුමන කුසලතාවයට අදාළ වේද?

(ල. 2 × 5 = 10)

06. (i) අතීත ව්‍යාපාර හා සැසඳීමේදී නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි වෙනස්කම් 02ක් ලියා දක්වන්න.

(ii) ව්‍යාපාර පරිසරයේ වෙනස්කම් අවබෝධකර ගැනීම තුළින් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රයෝජන 02ක් නම් කරන්න.

(iii) බාහිර පරිසර සාධක 04ක් නම් කරන්න.

(iv) අභ්‍යන්තර පරිසරයේ දැකිය හැකි ශක්තීන් 02ක් සඳහන් කරන්න.

(v) පොලී අනුපාතිකය, මිල මට්ටම, සේවා නියුක්තිය ආදී විචල්‍යයන් අයත් වන ව්‍යාපාර පරිසරය නම් කරන්න.

(ල. 2 × 5 = 10)

07. (i) ව්‍යාපාර ආයතනයකට "තර්ජනයක්" වන ආකාරයේ සාධක 02ක් නම් කරන්න.

(ii) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ 03 සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාව සතු සම්පතක් ලෙස, මානව සම්පතේ පවතින සුවිශේෂී තත්වයන් මොනවා ද?

(iv) ඔබ ප්‍රදේශයේ සුලබව පවතින ගැටලුවක් සඳහන් කර එය විසඳීම සඳහා සුදුසු පිළියමක් යෝජනා කරන්න.

(v) ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන මානව නොවන සම්පත් 02ක් සඳහන් කරන්න.

(ල. 2 × 5 = 10)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2025**

**10 ශ්‍රේණිය** **ව්‍යවසායකත්ව අධ්‍යයනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(1) | 3 -(2) | 4 -(3) | 5 -(1) | 6 -(2) | 7 -(3) | 8 -(2) | 9 -(4) | 10 -(4) |
| 11 -(1) | 12 -(1) | 13 -(2) | 14 -(3) | 15 -(4) | 16 -(3) | 17 -(4) | 18 -(2) | 19 -(3) | 20 -(3) |
| 21 -(1) | 22 -(4) | 23 -(4) | 24 -(3) | 25 -(2) | 26 -(2) | 27 -(1) | 28 -(2) | 29 -(3) | 30 -(3) |
| 31 -(1) | 32 -(1) | 33 -(2) | 34 -(3) | 35 -(4) | 36 -(4) | 37 -(3) | 38 -(2) | 39 -(1) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය, අවදානම් දැරීම, පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම.

ii. අවශ්‍යතාව - ආහාර
වුවමනාව - බෝ නොවන රෝග සඳහා ගැලපෙන ආහාර, දේශීය ආහාර

iii
- දේශීය සම්පත් උපයෝජනය
- ප්‍රාදේශීය සංවර්ධනය
- රැකියා අවස්ථා ජනනය
- රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළයාම
- ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීම.

iv වෙළඳපොළ වෙනස් වීමක්

v දුර්වලතාව:- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැති වීම
ශක්තිය :- උඩිත සූපවේදය හා හෝටල් කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.

vi
- අයිතිකරු
- සේවකයන්

vii ව්‍යාපාර ව්‍යවසායකයෙක්

viii
- ව්‍යාපාර සැලසුම් සකස් කිරීම
- සැලසුමට අනුව කටයුතු සිදුවනවාදැයි සොයා බැලීම.

ix ද්විතීක අංශයේ

x
- විවිධත්වය ග්‍රහණය කර ගැනීම
- නිර්මාණාත්මක හැසිරීම් ආදර්ශනය කිරීම
- අසාර්ථකත්ව ඉවසීම
- කුතුහලය දිරිමත් කිරීම
- ගැටලු අභියෝග ලෙස දැකීම
- නිර්මාණශීලී පුහුණු අවස්ථා (ල. 2 x 10 = 20 යි.)

(02) i. පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදනය බිහි කිරීමෙහි යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ වූ ක්‍රියාවලියකි. (ල. 2)

ii. නිෂ්පාදන සාධක :-
- භූමිය • ශ්‍රමය • ප්‍රාග්ධනය • ව්‍යවසායකත්වය (සාධක දෙකක් නම් කිරීමට ල. 01, සාධකයක් විස්තර කිරීමට ල. 01)

iii.
- විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම. • යම් ගැටලුවකට එක් විසඳුමක් පමණක් ඇතැයි සිතීම.
- ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම.
- තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම
- ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
- රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම
- වැරදි හා විවේචන සඳහා ඇති බිය. (ල. 02)

iv. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා සම්බන්ධ සියලු කටයුතු වේ. (ල. 02)

v.
- මූලිකව පැනනගී
- සීමිතය
- සියලු දෙනාට පොදුය.
- උත්පත්තියත් සමග ඇති වේ. (ල. 02)

(03) i.
- ආර්ථික කටයුත්තක යෙදීම
- අවදානමකට මුහුණ දීම.
- ගනුදෙනුවල නිරත වීම.
- සම්පත් භාවිතා කිරීම.
- නිෂ්පාදනය, මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම
- ස්වයං පෙළඹවීමක් තිබීම
- තරගයට මුහුණ දීම.
- පැවැත්ම ගැන සිතීම. (කරුණු 1 ලකුණු ½ බැගින් ල. 02)

ii. සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මක ව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයෝ වේ.
(කරුණකට ල. 01යි. උදාහරණයකට ල. 01)
උදා:- මහත්මා ගාන්ධිතුමා, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ... ආදී.

iii.
- විවිධත්වය කර ගැනීම
- නිර්මාණශීලී පුහුණු අවස්ථා
- අසාර්ථකත්වය ඉවසීම
- නිර්මාණශීලීත්වය අගය කිරීම
- කුතුහලය දිරිමත් කිරීම
- නිර්මාණාත්මක හැකියා ආදර්ශනය කිරීම.
- ගැටලු අභියෝග ලෙස දැකීම. (කරුණකට 01 බැගින් කරුණු දෙකට ලකුණු 02 යි)

iv. සංකලනයන් (ල. 02)

v.
- අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ද ඉහළ වේ.
- අවදානම පහළ නම් ප්‍රතිලාභය ද පහළ වේ.

(04) i. නවෝද්පාදනයේ ආරම්භය නිර්මාණශීලී අදහසකි. ඒ අනුව නිර්මාණශීලී අදහස් පයෝජනවත් දෙයකට පරිවර්තනය කිරීම නවෝත්පාදනය මගින් සිදු වේ. (අදහස පැහැදිලි වේනම් ල. 02)

ii.
- කැපවීම
- ආත්ම විශ්වාසය
- සාමාන්‍ය වැටහීම
- තොරතුරු සොයා බැලීම
- ස්වයං පෙළඹවීම
- දැඩි ආශාව (ගති ලක්ෂණ 01 ක ල. 01 බැගින් ල. 02)

iii. • රැකියා ලබා දීම. • නිවාස අහිමි වූවන්ට නිවාස සාදා දීම
• පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම.
• ගොඩනැගිලි ඉදිකර දීම හා උපකරණ ලබා දීම. • රජයේ සුභ සාධන කටයුතුවලට උදව් කිරීම
• හදිසි ස්වාභාවික විපත්වලදී උපකාරී වීම. (එකකට ල. ½ බැගින් කරුණු 04ට ල. 02)

iv. • ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම. • කාර්යන්හි විවිධත්වයක් ඇති වීම.
• සමාජයීය සුභසාධනය සඳහා දායක විය හැකි වීම.
• ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකිවීම. • ආකර්ශනීය ලාභයක් ඉපයීම.
• ස්වයංපෝෂිත බව • වර්ධනයට ලැබෙන උපරිම අවකාශය
• නිදහස හා ඉතා ඉහළ තෘප්තියකට පත්වීම (කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

v. • කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම • සේවක සංඛ්‍යාව අඩු වීම.
• ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතුවීම.
• ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තීරණ ගැනීමට ඇති පහසුව
• ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට පමණක් සීමා වීම. (කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

(05) i. • සේවා නියුක්තිය වැඩිවීම • ජාතික නිෂ්පාදනය වැඩිවීම. • ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම.
• මහා පරිමාණ ව්‍යාපාර තුළින් නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම.
• මහා පරිමාණ ව්‍යාපාර බවට පත්වීම. • දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම.
(කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

ii. • ව්‍යාපාරයේ මුදල් කටයුතු පාලනය දුර්වල වීම. • තරගකාරීත්වයට මුහුණ දීමට අබහසු වීම.
• ව්‍යාපාර කටයුතු සැලසුමකින් තොරව සිදු කිරීම. • ව්‍යවසායකයෙකු ලෙස නොසිතීම.
• සම්පත් නිවැරදි ව පාලනය නොකිරීම. පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම. • දුර්වල මානව සම්බන්ධතා.
(කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

iii. • සේවකයින් පෙළඹවීම හා අවශ්‍ය මග පෙන්වීම. • කාර්යය ඉටු කරගැනීමේ දී සේවකයින් මෙහෙයවීම.
(කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

iv. අනාගතයේදී ව්‍යාපාරික කටයුතු සාර්ථක කරගැනීමට අවශ්‍ය තීරණ ගැනීම, ඒවා වැඩි දියුණු කිරීම හා ඊට අවශ්‍ය උපාය මාර්ග තීරණය කොට ක්‍රියාත්මක කිරීම වැනි කාර්යය කිරීමට ඇති හැකියාව වේ. (අදහස තිබේනම් ල. 02)

v. සන්නිවේදන කුසලතා. (ල. 02)

(06) i. • අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වී ඇත. තරගකාරීත්වය වැඩි වීම.
• ජනතාව මූලික අවශ්‍යතා ඉතා උසස් මට්ටමකින් සපුරා ගැනීමට උනන්දු වීම.
• භාණ්ඩ හා සේවා රාශියකි. • පාරිභෝගිකයන් බලවත් වීම. • ගෝලීය වශයෙන් ව්‍යාප්තව තිබීම.
• වෙනස්වීමේ වේගය ඉතා වැඩි ය. සමාජ වගකීම් ඉටු කිරීම වැනි වෙනත් අරමුණු පැවතීම.
(කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

ii. • ව්‍යාපාරය සතු ශක්ති හා දුර්වලතා හඳුනා ගැනීම. • පරිසරයේ පවතින විවිධ ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම.
• ව්‍යාපාරය මුහුණ දෙන තර්ජන හඳුනා ගැනීම.
• පරිසර වෙනස් වීම්වලට ගැළපෙන පරිදි නිෂ්පාදන හා අලෙවි කටයුතු පවත්වාගෙන යාම.
• පරිසර වෙනස්වීම්වලට ගැළපෙන පරිදි සැලසුම් සකස් කිරීම හා උපාය මාර්ග තීරණය කිරීම.
(කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)

iii. • ආසන්න පරිසරය • සමාජ හා සංස්කෘතික පරිසරය
• ආර්ථික පරිසරය • ප්‍රජා පරිසරය
• ස්වභාවික පරිසරය • තාක්ෂණික පරිසරය
• දේශපාලන හා නෛතික පරිසරය • ගෝලීය පරිසරය
(කරුණු 01ට ල. ½ බැගින් කරුණු 04ට ල. 02 යි)

iv. ගැළපෙන ශක්තීන් දෙකක් (ල. 02)

v. ආර්ථික පරිසරය (ල. 02)

(07) i. ගැළපෙන තර්ජන දෙකක් (ල. 02)

ii. • ප්‍රාථමික අංශය • ද්විතීයික අංශය
• තෘතීයික අංශය (ල. 02)

iii. • සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතීම.
• ඉගෙනීමට ඇති දක්ෂකම (කරුණු 02 ට ල. 02 යි)

iv. ගැටලුවක් ඉදිරිපත් කිරීමට (ලකුණු 01)
ගැළපෙන විසඳුමට (ලකුණු 01)

v. • ස්වාභාවික සම්පත් • ඛනිජ සම්පත්
• සංස්කෘතික සම්පත් • ස්වාභාවික වනාන්තර
• සත්ත්ව සම්පත් (කරුණු 01ට ල. 01 බැගින් කරුණු 02ට ල. 02 යි)